**රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව - 2022**

**---------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාව අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාව වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සංස්ථාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.5.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත සපයා තිබුණු ඖෂධ වෙනුවෙන් වසරකට වඩා වැඩි ලැබිය යුතු ශේෂය වන රු. 14,030,172 ක වටිනාකමක් මැයි 29 දින වන විටත් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | සියළුම ණයගැති කාලසීමාව ඉකුත් වූ ඉන්වොයිස්පත් නිරවුල් කර ගැනීමට 2023 වර්ෂයේදී දැඩි පරිශ්‍රමයක් දැරීමට බලාපොරොත්තු වන බව. | හිඟ මුදල් අය කර ගැනීම සඳහා නිරන්තර පසු විපරමකින් කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමුද්‍රව්‍ය සපයා ගැනීම වෙනුවෙන් බද්ධ ව්‍යාපාර 04 ක් සඳහා 2022 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ශේෂය රු.3,593,491,982 ක් වූ අතර, ඒ අතරින් රු.2,080,068,385 ක්, එනම් සියයට 58 ක ප්‍රමාණයක් අනුමත ණය ගෙවීම සඳහා ඉඩ ලබාදී ඇති දින 50 ක කාලය ඉක්මවා තිබුණි. | අප ආයතනය වෙත භාණ්ඩාගාරයෙන් මුදල් නොලැබීම මත බද්ධ ව්‍යාපාර වලට ගෙවීමට හැකියාවක් නොතිබීම හේතුවෙන් මුදල් ගෙවීම් කාලය දින 50 ක් ඉක්මවා ඇති බව. | ණයහිමියන් නියමිත කාලසීමාව තුළ විධිමත් ලෙස පියවීමට කටයුතු කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1983 අංක 12 දරන පාරිතෝෂික පනතේ 06(2)(අ) වගන්තිය. | සේවකයා සම්පූර්ණ වශයෙන් සේවය කරන ලද එක් එක් වර්ෂය සඳහා මාස භාගයක වැටුප හෝ වේතනය මත පදනම්ව සේවක පාරිතෝෂික වෙන් කිරීම් සිදු කළ යුතු වුවද, ඒ වෙනුවට සේවකයාගේ සම්පූර්ණ මාසයක වැටුප පදනම් කර ගෙන සේවක පාරිතෝෂික වෙන් කිරීම් සිදු කර තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී විශ්‍රාම ගොස් තිබුණු නිලධාරීන් 05 දෙනෙකු වෙත පාරිතෝෂික දීමනා ලෙස රු.2,050,793 ක් වැඩියෙන් ගෙවා තිබුණි. | සියලු ගෙවීම් ඇතුලත් මූල්‍ය අත්පොත අධ්‍යක්ෂ මණ්ඩලය මගින් අනුමත කර ඇති බැවින් ඒ අනුව ගෙවීම් කර ඇති බව. | පනතේ අදාළ වගන්තිවල දැක්වෙන විධි විධාන වලට අනුකූලව සේවක පාරිතෝෂික වෙන් කිරීමට හා ගෙවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයෙහි මුදල් රෙගුලාසි 388 | තැපැලෙන් යවනු ලබන සියළුම චෙක්පත් පිළිබඳ විස්තර අඩංගු ලේඛණයක් පවත්වාගෙන යා යුතු වුවත්,ඒ අනුව කටයුතු කර නොතිබුණි. | තැපැලෙන් යවනු ලබන සියළුම චෙක්පත් පිළිබද විස්තර අඩංගු ලේඛණයක් දැනට පරිගණකයේ පවත්වාගෙන යනු ලබන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1997 පෙබරවාරි 03 දිනැති අංක 6/97 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 වන ඡේදය. | වැඩ බැලීමේ කාලය මාස 3 ක උපරිමයකට යටත් විය යුතු වුවද, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි වට්ටෝරු හා පර්යේෂණ තනතුර සඳහා අඛණ්ඩව වර්ෂ 05 කට අධික බැලීමේ පදනම මත නිලධාරියෙකු බඳවා ගෙන තිබුණි. | පුරප්පාඩු පියවීම සඳහා අවස්ථා කිහිපයකදී අයදුම්පත් කැඳවූ නමුත් තනතුරට සුදුසු අයදුම්කරුවන් නොසිටි බැවින්ය. දැනට බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ (PED) අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඈ) | 2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය. | එක් නිලධාරියෙකුට ගෙවිය හැකි උපරිම ආපදා ණය මුදල රු.250,000 කට සීමා කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් 49 දෙනෙකු වෙත එම සීමාව ඉක්මවා රු.4,677,100 ක් ගෙවා තිබුණි. | සියලූ ගෙවීම් ඇතුලත් මූල්‍ය අත්පොත අධ්‍යක්ෂ මණ්ඩලය මගින් අනුමත කර ඇති බැවින් ඒ අනුව ණය අත්තිකාරම් සදහා ගෙවීම් කර ඇති බව. | සංස්ථාවට ආවේනික වූ ආයතන සංග්‍රහයක් පිළියෙල කර භාණ්ඩාගාර අනුමැතිය ලබා ගන්නා තෙක් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අදාළ කර ගත යුතුය. චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව ගෙවීම් කළ යුතුය |
| (ඉ) | 2022 දෙසැම්බර් 21 දිනැති අංක පීඊඩී 09/2022 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | වාර්ෂිකව රු.20,000 ක ප්‍රසාද දීමනාවක් පමණක් ගෙවිය හැකි වුවද, අනුමත සීමාව ඉක්මවා රු.3,130,193 ක ප්‍රසාද දීමනාවක්ද ගෙවා තිබුණි. | සියලූ ගෙවීම් ඇතුලත් මූල්‍ය අත්පොත අධ්‍යක්ෂ මණ්ඩලය මගින් අනුමත කර ඇති බැවින් සේවකයන් තව දුරටත් දිරිමත් කිරිම සඳහා මෙම විශේෂ ප්‍රසාද දීමනාව ලබාදීමට කටයුතු කරන ලද බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ප්‍රසාද දීමනා ගෙවිය යුතුය. |
| (ඊ) | 2022 අප්‍රේල් 26 දිනැති 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 03 (x) | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් යටතේ මාණ්ඩලික නිලධාරීන් වෙත ලබාදෙනු ලබන ණය පහසුකම් 2022 දෙසැම්බර් 31 වන දින තෙක් අත්හිටුවිය යුතු බව දන්වා තිබුන ද, ඉන් බැහැරව මාණ්ඩලික නිලධාරීන් 11 දෙනෙකු වෙත රු.3,980,625 ක ආපදා ණය ගෙවා තිබුණි. | සියලූ ගෙවීම් ඇතුලත් මූල්‍ය අත්පොත අධ්‍යක්ෂ මණ්ඩලය මගින් අනුමත කර ඇති බැවින් සේවකයන් තව දුරටත් දිරිමත් කිරිම සඳහා මෙම විශේෂ ප්‍රසාද දීමනාව ලබාදීමට කටයුතු කරන ලද බව. | මූල්‍ය අත්පොතට නොව අදාල අයවැය චක්‍රලේඛ වලට අනුගතව කටයුතු කළ යුතුය |
| (උ) | 2009 මාර්තු 09 දිනැති අංක ඩීඑම්එස්/ඊ4/10/4/090/2 දරන සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් ඇමතු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය. | | | |
| | (i) 03ඡේදය. | a) පැමිණීමේ දිරි දීමනා ලෙස මසකට එක් | සියලූ ගෙවීම් ඇතුලත් මූල්‍ය අත්පොත අධ්‍යක්ෂ | අධ්‍යක්ෂක මණ්ඩල තීරණ ක්‍රියාත්මක |

| | | | |
|---|---|---|---|
| | සේවකයෙකුට රු.2,000 ක් පමණක් ගෙවීමට අනුමැතිය ලැබී තිබුණද එය රු.3,500 ක් දක්වා වැඩි කර ගෙවා තිබුණි. | මණ්ඩලය මගින් අනුමත කර ඇති බැවින් ඒ අනුව ගෙවීම් කර ඇති බව. | කිරීමට පෙර අදාළ අවස්ථාවලදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතුය. |
| | b) පැමිණීමේ දිරිදීමනා ගෙවන්නේ නම් වර්ෂය අවසානයේ ඉතිරි නිවාඩු සඳහා මුදල් ගෙවිය නොහැකිවුවද, පැමිණීමේ දිරි දීමනාව ගෙවා තිබුණු සේවකයින් සඳහා සමාලෝචිත වර්ෂය අවසානයේ ඉතිරි නිවාඩු වෙනුවෙන්ද රු.11,960,822 ක් ගෙවා තිබුණි. | සියලූ ගෙවීම් ඇතුලත් මූල්‍ය අත්පොත අධ්‍යක්ෂ මණ්ඩලය මගින් අනුමත කර ඇති බැවින් ඒ අනුව ගෙවීම් කර ඇති බව. | අධ්‍යක්ෂක මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීමට පෙර අදාළ අවස්ථාවලදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතුය. |
| (ii) 04 ඡේදය. | අවුරුදු හා නත්තල් වෙනුවෙන් වර්ෂයකට එක් අයෙකුට එක් වතාවක් පමණක් රු.6,000 ක තෑගි වවුචර් ලබාදිය හැකි වුවද, සමාලෝචිත වර්ෂය තුළදී ස්ථිර සේවකයන්ට රු.25,000 ක් බැගින් හා පුහුණු සේවකයන්ට රු.12,500 ක් බැගින් වූ මුළු පිරිවැය රු.7,392,062 ක් වූ තෑගි වවුචර්ද, ඊට අමතරව පාසල් පොත් හා උපකරණ මිලදී ගැනීමට ස්ථිර සේවකයෙකුට රු.12,500 ක් බැගින් හා අනෙකුත් සේවකයන්ට රු.6,250 ක් බැගින් මුළු පිරිවැය රු.5,087,500 ක් වූ තෑගි වවුචර්ද ලබාදී තිබුණි. | සියලූ ගෙවීම් ඇතුලත් මූල්‍ය අත්පොත අධ්‍යක්ෂ මණ්ඩලය මගින් අනුමත කර ඇති බැවින් ඒ අනුව ගෙවීම් කර ඇති බව. | අධ්‍යක්ෂක මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීමට පෙර අදාළ අවස්ථාවලදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතුය. |
| (iii) 06 ඡේදය. | යම් සේවකයෙකුට නියමිත සේවා මුර සියල්ලටම පැමිණියහොත් පමණක් රු.1,000 ක මාසික දීමනාවක් ගෙවිය හැකි වුවද, සහභාගී වූ එක් එක් සේවාමුරයක් වෙනුවෙන් | සියලූ ගෙවීම් ඇතුලත් මූල්‍ය අත්පොත අධ්‍යක්ෂ මණ්ඩලය මගින් අනුමත කර ඇති බැවින් ඒ අනුව ගෙවීම් කර ඇති බව. | අධ්‍යක්ෂක මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීමට පෙර අදාළ අවස්ථාවලදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත |

| | | | | |
|---|---|---|---|---|
| | | විධායක, පුහුණු වන විධායක හා විධායක නොවන සේවකයන්ට පිළිවෙලින් රු.400 ක්, රු.300 ක් හා රු.200 ක් බැගින් වන පරිදි සමාලෝචිත වර්ෂය තුළදී රු.6,399,800 ක් සේවාමුර දීමනාව වශයෙන් ගෙවා තිබුණු අතර, වැඩිපුර ගෙවා තිබුණු සේවාමුර දීමනා රු.3,326,800 ක් විය. | | යුතුය. |
| (ඌ) | 2015 ජුනි 04 දිනැති අංක BP/30/15 හා 2022 සැප්තැම්බර් 22 දිනැති අංක BP/62/22 දරන අධ්‍යක්ෂක මණ්ඩල තීරණ | සංස්ථාවේ සේවකයන් සඳහා ගෙවනු ලබන පා පැදි ණය 2015 ජුනි 04 දින සිට රු.3,000 සිට රු.75,000ක් දක්වා වැඩිකර තිබුණු නමුත් ඒ සඳහා ලබා ගත යුතු භාණ්ඩාගාර අනුමැතිය මේ දක්වාම ලබාගෙන නොතිබුණි. | සියලු ගෙවීම් ඇතුලත් මූලා අත්පොත අධ්‍යක්ෂ මණ්ඩලය මගින් අනුමත කර ඇති බැවින් ඒ අනුව ගෙවීම් කර ඇති බව. | භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කල යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.965,472,451 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.1,006,185,465 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.40,713,013 ක එනම් සියයට 4.05 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට විකුණුම් හා බෙදාහැරීමේ වියදම් සියයට 333 කින් හා බදු වියදම සියයට 171 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2 ප්‍රධාන වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය**

ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ විකිණීමේ හා බෙදාහැරීමේ වියදම් පිළිවෙලින් රු. 109,186,789 ක් හා රු.472, 762,064 ක් වූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ එම වියදම සියයට 333 කින් ඉහල ගොස් තිබුණි. එහි ඇතුළත් සමාලෝචිත වර්ෂය තුළ සිදු කරන ලද රු.312,417,918 ක අඩමාන ණය වෙන්කිරීම ඊට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**2.3 අනුපාත විශ්ලේෂණය**

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දළ ලාභ අනුපාතය සහ ශුද්ධ ලාභ අනුපාතය පිළිවෙළින් සියයට 4.4 කින් සහ සියයට 5 කින් අඩුවී තිබුණු අතර ණයගැති පිරිවැටුම් අනුපාතයේ වාර 16 ක අඩුවීමක් ද, ණය අයකර ගැනීමේ කාලයේ දින 17 ක වැඩිවීමක් ද විය.

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2022 දෙසැම්බර් 31 දිනට ජංගම නොවන වත්කම්වල ඇතුළත් පිරිවැය රු.21,962,722 ක් වූ අයිතම 82 ක් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සිදු කර තිබුණු භෞතික සමීක්ෂණයට ලක්වී නොතිබුණු අතර මෙම අයිතම ඌනතා වශයෙන්ද දක්වා නොතිබුණි. | ඌනතා මහහැර 2023 වර්ෂයේ නිසි පියවර ගැනීමට කටයුතු කරනු ලබන බව. | සංස්ථාවේ සියලුම ජංගම නොවන වත්කම් භෞතික සමීක්ෂණයට ලක්වීය යුතු අතර ඌනතා හා අතිරික්තතා හඳුනාගෙන වාර්තා කළ කළ යුතුය. |
| (ආ) ස්ථාවර වත්කම් හඳුනා ගැනීමේදී කුමන අගයකින් යුත් වත්කමක් ස්ථාවර වත්කම් ලෙස හඳුනාගත යුතුද යන්න පිළිබඳ ප්‍රතිපත්තියක් සංස්ථාව සතුව නොතිබුණි. | සංස්ථාව සතු සියලු වත්කම් කාණ්ඩයන් හඳුනා ගැනිමේ නිර්ණායකයන් නිර්දේශ කොට දේපල, පිරියත හා උපකරණ සඳහා වන ප්‍රතිපත්තියක් 2023 වර්ෂයේදී හඳුන්වාදීමට කටයුතු කරනු කරනුලබන බව. | පිරියත හා උපකරණ සඳහා වන ප්‍රතිපත්තියක් 2023 වර්ෂයේදී හඳුන්වාදීමට කටයුතු කළයුතුය. |
| (ඇ) මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනට ණයහිමියන් දෙදෙනෙකුගේ ශේෂයන්, ඍජු ශේෂ සනාථන ශේෂයන් හා නොසැසදුන අතර ණයහිමි ශේෂය රු.1,285,995 කින් ඌන තක්සේරු වී තිබුණි. | සනාථ ශේෂයන් නිවැරදි ලෙස දක්වා නොමැති බව හා ගෙවීමට ඇති ලෙස සඳහන් ඉන්වොයිස් පත් මේ වන තෙක් සංස්ථාව වෙත ලැබී නොමැති බව. | වසර අවසානයේදී ගෙවිය යුතු ශේෂයට අදාල ශේෂ සනාථන නිවැරදිව ලබා ගැනීමට කටයුතු කල යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අලෙවි සැලැස්මට හා මාසික නිෂ්පාදන සැලැස්මට අනුව හඳුනාගෙන තිබුණු මුළු නිෂ්පාදන අවශ්‍යතාවය අතර ඖෂධ වර්ග 71 ක ඒකක මිලියන 777.576 ක වෙනසක් පැවතුණි. | බොහෝ මාස වල සියයට 10 ප්‍රතිශතයක් තුල වසරේ මාස 09 ඉලක්කය සපුරා ඇත. සියයට 25 තුළ සියලු මාස වල ඉලක්කය සපුරා ඇත. වෛද්‍ය සැපයුම් අංශයේ ඉල්ලුමට සරිලන පරිදි සංස්ථාවේ ඖෂධ නිෂ්පාදනය ප්‍රමාණවත් වුවද ඇතැම් ඖෂධ සම්බන්ධයෙන් | වාර්ෂික අලෙවි සැලැස්මේ ඉලක්ක කරා ළඟාවීමට උපරිම උත්සාහය දැරිය යුතු අතරම මාසික නිෂ්පාදන සැලසුම් වලටද අනුගත විය යුතුය. |

| | | |
|---|---|---|
| | වෛද්‍ය සැපයුම් අංශයේ සමස්ථ ඉල්ලුම සපුරාලීමට නොහැකි වී තිබූ බව. | |
| (ආ) 2022 වර්ෂය සඳහා සංස්ථාවේ අලෙවි අංශය විසින් ලබා දුන් අලෙවි සැලැස්මෙහි ඇතුළත් ඖෂධ වර්ග 29 ක මුළු අවශ්‍යතාවය ඒකක මිලියන 2,545.180 ක් වූ අතර එම ඖෂධ 29 න් සමාලෝචිත වර්ෂය තුල සත්‍ය නිෂ්පාදනය ඒකක මිලියන 1,408.081 ක් පමණක් වූ බැවින් නිෂ්පාදන අවශ්‍යතාවය සහ සත්‍ය නිෂ්පාදනය අතර ඒකක මිලියන 1,137.099 ක ඌනතාවයක් දක්නට ලැබුණි. | 2021 වර්ෂයේදී ආයතන පෙති හා කරල් මිලියන 3043.5 නිෂ්පාදනය කරනු ලැබූ අතර 2023 වර්ෂයේදී එය පෙති කරල් ඒකක මිලියන 3302.1 ක් දක්වා වර්ධනය විය. 2022 වර්ෂයේදී ශ්‍රීලංකාව තුල තිබූ ආර්ථික අර්බුධය හේතුවෙන් පුරෝකතනය කල ඖෂධ නිෂ්පාදනය හා සැපයීම සැලසුම් විශාල ලෙස වෙනස් වී ඇති බව. | උපරිම නිෂ්පාදන කාර්යක්ෂමතාවයෙන් සහ ඵලදායීතාවයෙන් නිෂ්පාදනය කිරීම සඳහා තාත්ත්වික නිෂ්පාදන සහ අලෙවි සැලසුම් පිළියෙල කළ යුතුය. |
| (ඇ) 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය අතර කාලය තුළ සමස්ථ අලෙවි ආදායම එක් එක් වර්ෂ වලදී බද්ධ ව්‍යාපාර නිෂ්පාදන වලින් සංස්ථාවේ අලෙවිය සඳහා දක්වන දායකත්වය ඉහළ ගොස් ඇති අතර, සංස්ථාවේ නිෂ්පාදන වලින් සංස්ථාවේ අලෙවිය සඳහා දක්වන දායකත්වය පහළ ගොස් තිබුණි. 2022 වර්ෂය සැලකීමේදී බද්ධ ව්‍යාපාර වලින් සමස්ථ ආදායමට වූ දායකත්වය සියයට 52.34 ක් සංස්ථාවේ නිෂ්පාදිත වලින් සමස්ථ ආදායමට වූ දායකත්වය සියයට 47.66 ක් වී තිබුණි. | රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව (SPMC) සමඟ බද්ධ ව්‍යාපාර ආරම්භ කරනු ලැබූයේ 2017 වසර අගදීය. මෙහිදී කැබිනට් අනුමැතිය 15 දෙනෙකු සඳහා ලැබුනද ඉන් 2017 වසරේ එක බද්ධ ව්‍යාපාරයක් ද 2018 වසරේ බද්ධ ව්‍යාපාර 02 ක්ද SPMC Logo යටතේ ඖෂධ සපයා ඇත. 2023 වර්ෂයේදී ද Sands Active හරහා පෙති හා කරල් නිෂ්පාදන සැපයීමට නියමිත අතර 2024 වර්ෂයේදී Sands Active මගින් Cephelesporine ඖෂධ හා කොග්ගල Premium හරහා insulin ඖෂධයන් සැපයීමට නියමිත අතර ඒ අනුව බද්ධ ව්‍යාපාර හරහා අලෙවි ආදායම තව දුරටත් වැඩි වනු ඇති බව. | පවතින නිෂ්පාදන ධාරිතාව වැඩි කර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |
| (ඈ) සංස්ථාව විසින් නිෂ්පාදනය කර තිබුණු ඖෂධ වර්ග 15 ක් නිෂ්පාදන පිරිවැයට වඩා අඩුවෙන් මිල නියම කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළදී එම ඖෂධ ඒවායේ නිෂ්පාදන | සංස්ථාවේ අලෙවි නියෝජිතයන් හරහා සිදුකරන රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව (SPMC) ඖෂධයන් අලෙවි කිරීමේදී ඒවායෙහි පිරිවැය | සංස්ථාවට අලාභයක් නොවන ලෙස කටයුතු කළ යුතු අතර අවම වශයෙන් නිෂ්පාදන පිරිවැය ආවරණය වන ලෙස මිල තීරණය කළ |

| | | |
|---|---|---|
| පිරිවැයට වඩා අඩුවෙන් අලෙවි කිරීම තුළින් රු.230,054,679 ක අලාභයක් සංස්ථාවට දැරීමට සිදුවී තිබුණි. | විශ්ලේෂණයන් කරනු ලබන්නේ සාමාන්‍යයෙන් වර්ෂයකට එක් වරක් පමණක් වන අතර එම අවස්ථාවේදී පවතින පිරිවැය පදනම් කර ගෙන SPMC නිෂ්පාදනයන් හි මිල සංශෝධනයට ලක් කරනු ලබන බව. | යුතුය. |
| (ඉ) සංස්ථාව විසින් නිෂ්පාදනය කරනු ලබන ඇතැම් ඖෂධ වල මිල තීරණය කිරීමේදී එහි නිෂ්පාදන පිරිවැයට වඩා සියයට 26 සිට 81 දක්වා ඉහළ ලාභාන්තිකයක් එකතු කර තිබුණි. | ඇතැම් නිෂ්පාදන වල මිල ගණන් සලකා බැලීමේ දී එම නිෂ්පාදනයන්හි පිරිවැය සලකා බලන විට ඉහල ලාභ ආන්තිකයක් පෙන්නුම් කල ද මෙම නිෂ්පාදනයන් සඳහා වන අනෙකුත් තරඟකාරී නිෂ්පාදනයන්ගේ වෙළඳපල මිල ඉහල අගයක් ගන්නා බැවින් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව විසින් නියම කරන මිල ගණන් වලට ඖෂධ මිලදී ගැනීම පාරිභෝගිකයාට වාසි දායක බව. | සමාජ සුබසාධනයද සලකා බලා ඖෂධ මිල තීරණය කල යුතුය |
| (ඊ) අමුද්‍රව්‍ය නොමැතිවීම, යන්ත්‍ර ධාරිතාවය ප්‍රමාණවත් නොවීම, නිෂ්පාදන ක්‍රියාවලියේ පවත්නා තාක්ෂණික දෝෂ ආදී විවිධ හේතුන් මත වෛද්‍ය සැපයුම් අංශය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඇණවුම් කර තිබුණු ඖෂධවලින් විකුණුම් වටිනාකම රු.723,571,830 ක් වූ ඖෂධ ඒකක මිලියන 122.53 ක ප්‍රමාණයක් සැපයීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි. | වර්තමානය වන විට රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව JICA ව්‍යාපෘතිය හරහා දෙවන වරටත් නිෂ්පාදනාගාර පහසුකම් පුලුල්කර ඇති අතර සේවකයන්ගේ උපරිම කැපවීම මත හා නව නිෂ්පාදනයන් වෙළෙඳපළට නිකුත් කිරීම හරහා මේ වන විට නිෂ්පාදනාගාරයේ ප්‍රශස්ත නිෂ්පාදන ධාරිතාවය කරා ලගා වී ඇති බව. | පවතින බාධාකාරී තත්ත්වයන් අවම කර ගනිමින් වෛද්‍ය සැපයුම් අංශයේ ඇණවුම් සම්පූර්ණ කිරීමට උපරිම උත්සාහය ගනිමින් තම වෙළඳපල කොටස ආරක්ෂා කර ගත යුතුය. |
| (උ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වෛද්‍ය සැපයීම් අංශය වෙත සපයා තිබුණු විකුණුම් වටිනාකම රු.13,927,795,651 ක් වූ ඖෂධ ඒකක මිලියන 2,969.65 අතරින් සංස්ථාවේ නිෂ්පාදන වලින් විකුණුම් වටිනාකම රු.5,365,222,678 ක්වූ ඖෂධ | සැලකිල්ලට ගන්නා ලද බව. | සංස්ථාව සිය උපරිම නිෂ්පාදන කාර්යක්ෂමතාවයෙන් කටයුතු කරමින් වඩාත් වාසිදායක නිෂ්පාදන මිශ්‍රණය තෝරාගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| ඒකක මිලියන 2,368.29 පමණක් සපයා තිබුණු අතර, ඉතිරි විකුණුම් වටිනාකම රු.8,562,572,974 ක් වූ ඖෂධ ඒකක මිලියන 601 බද්ධ ව්‍යාපාර සැපයුම් මඟින් ලබාදී තිබුණි. එසේ වුවද, බද්ධ ව්‍යාපාර සැපයූ ඖෂධ ඒකක ප්‍රමාණයට සාපේක්ෂව වැඩි ඖෂධ ඒකක ප්‍රමාණයක් වෛද්‍ය සැපයුම් අංශයට සැපයීම තුළින් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව විශාල දායකත්වයක් රටට ලබාදී තිබුණි. | | |
| (ඌ) සිදුකරන ලද නියැදි පරීක්ෂාවට අනුව බෙදාහරින්නන් විසින් විකුණුම් වෙනුවෙන් සංස්ථාවට ඉදිරිපත් කරන ලද චෙක්පත් වලට ගෙවීම් සිදුකිරීම නතර කිරීම හේතුවෙන් ඉන්වොයිස් පත් 03 කට අයත් රු. 1,915,999 වටිනාකමින් යුත් චෙක්පත් අගරු වී තිබුණි. ඒ අනුව බෙදාහරින්නන් විසින් වෙළෙඳ වට්ටම් හිමිකර ගත්තද ඔවුන්ගෙන් නිසි වේලාවට මුදල් අයකර ගැනීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි. | ඉදිරියේදී මෙවැනි තත්වයන් අවම කිරීමට කටයුතු කරන බව. | මෙවැනි තත්වයන් අවම කිරීමට කටයුතු කළ යුතුය |
| (එ) සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙලකර තිබුණු අලෙවි සැලසුම තුළ ඇතුළත් නොවූ වටිනාකම රු.මිලියන 1408.46 ක් වූ ඒකක මිලියන 71.186 කින් සමන්විත ඖෂධ හා වෙනත් අයිතම 38 ක් 2022 වර්ෂය තුළ අලෙවිකර තිබුණි. | වෛද්‍ය සැපයුම් අංශයෙන් ලද ඇණවුම් හා වෙළඳපොළ තුල ඉල්ලුම අනුව මෙම අයිතමයන්හි සත්‍ය විකුණුම් ප්‍රමාණයන් ඒවායෙහි ඇස්තමේන්තුගත අගයන්ගෙන් විචලනය වී ඇති බව. | නියමිත පරිදි අලෙවි සැලැස්ම සකස් කල යුතුය |

| | | |
|---|---|---|
| (ඒ) 2022 වර්ෂය තුළදී ඖෂධ වර්ග 30 කින් ඒකක මිලියන 351.907 ක අලෙවි ඉලක්කයන් සපුරාගත නොහැකිවී තිබුණද, මෙම ඖෂධවල මිලෙහි සිදුවූ වෙනස නිසාවෙන් අලෙවි සැලසුමෙහි වූ ආදායම් වටිනාකම ඉක්මවා රු.මිලියන 2,622.10 සත්‍ය ආදායම් වටිනාකමක් ලබාකර ගෙන තිබුණි. | අමුද්‍රව්‍ය මිල ඉහල යෑම හේතුවෙන් මිල ගණන් ඉහල දැමීමට සිදු වී ඇත. 2022 වර්ෂය ආරම්භයේදී රු.203 ට පැවති ඩොලරයක මිල සීඝ්‍ර ලෙස වැඩි වෙමින් රු.380 පමණ දක්වා වැඩි විය. ඒ අනුව, අමු ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා අප හට වැඩි මිලක් ගෙවීමට සිදු විය. මෙසේ ඩොලරය වැඩිවීම හේතුකොට ඖෂධ නියාමන අධිකාරිය (NMRA) මගින් අවස්ථා කිහිපයකදී මෙම නිෂ්පාදනයන්ගේ උපරිම සිල්ලර මිල ඉහළ දැමීම සිදුකරන ලද බව. | පවතින තත්ත්වයට අනුගත විය යුතු අතර මහජන සුබසාධනයද සලකා බැලිය යුතුය. |
| (ඔ) 2022 ජූලි මස සිට 2022 දෙසැම්බර් මස දක්වා කාලසීමාව තුළ සංස්ථාව විසින් බෙදාහරින්නන් 48 දෙනෙකු අතරින් 16 දෙනෙකුට දෙන ලද රුපියල් 101,456,371 ක් වටිනාකමැති අලෙවි ඉලක්ක සපුරාලීමට නොහැකි වී තිබුණි. | ඖෂධ නිෂ්පාදන සංස්ථාව විසින් බෙදාහරින්නන් සඳහා ලබාදී ඇති අවම මාසික විකුණුම් ඉලක්කය රුපියල් මිලියන දෙකක් වන නමුත්, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ සීමාකාරී නිෂ්පාදන පහසුකම් හේතුවෙන් නිෂ්පාදනයේදී වෛද්‍ය සැපයීම් අංශය (MSD) ඇණවුම් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙන බැවින් විවෘත වෙළඳපළ ඉල්ලුම සපුරාලීම සඳහා අලෙවි අංශයට ලැබෙනුයේ ඉතා සීමිත තොග ප්‍රමාණයක් පමණක් බව. | නිෂ්පාදන ධාරිතාවය වැඩිකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඕ) අලෙවි අංශය නිකුත් කළ සමහර ඉන්වොයිස් සඳහා අනුමැතිය ලබාදී නොතිබුණු අතර සමහර ඉන්වොයිස් පරීක්ෂා කළ බවට අත්සන් කර නොතිබුණු නමුත් ඒවා අනුමත කර තිබුණි. | අලෙවි අංශයේ සීමිත සේවක සංඛ්‍යාවක් සිටින බැවින් ඉන්වොයිස් පත් පරීක්ෂා කිරීමට නොහැකි වූ බව. | සියලුම ඉන්වොයිස් පත් පරීක්ෂා කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය තුළදී රු.492,452,048 ක් වැයකර ඖෂධ අමුද්‍රව්‍ය මිලදී ගැනීමේ අවස්ථා 06 කදී, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 හා 4.2.3 ප්‍රකාරව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් ප්‍රසම්පාදන සැලැස්මක් සහ ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙල කර නොතිබුණු අතර, පොදු කොන්ත්‍රාත් පනත යටතේ කොන්ත්‍රාත්තුව ලියාපදිංචි කිරීමේ සහතිකය සැපයුම්කරු වෙතින් ලබා ගෙන නොතිබුණි. | විගණනයෙන් පෙන්වා දුන් අන්දමට ප්‍රසම්පාදන සැලැස්ම සහ ප්‍රසම්පාදන කාලසටහන ප්‍රසම්පාදන ලිපිගොනුවලට ඇතුලත්කිරීම මේ වන විට සිදු කරමින් පවතින බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ වලට අනුව කටයුතු කළ යුතු අතරම ප්‍රසම්පාදන කමිටු නිර්දේශවලට මෙන්ම ඇණවුම් කොන්දේසි වලට අනුකූලවන ලෙස පසු ප්‍රසම්පාදන කටයුතුද සිදු කළ යුතුය. |
| (ආ) 2020 වසරේ කොවිඩ් 19 වසංගතය ඉතා උග්‍රව පැතිරී ගිය කාලසීමාව තුළ වෛද්‍ය සැපයුම් අංශයේ උපදෙස් පරිදි ප්‍රසම්පාදනය කර තිබූ රු.6,698,610 ක් වූ Chloroquine Phosphate BP අමුද්‍රව්‍ය අයිතමයෙන් ඒකක 600 ක ජීව කාලය, ඖෂධ අමුද්‍රව්‍ය ගබඩාවට ලැබුණු දින සිට වසර 02 කට වඩා ඉක්මවා තිබුණි. 2025 මාර්තු 31 දින වන විට මෙම අමුද්‍රව්‍ය තොග කල් ඉකුත් විමට නියමිතව ඇති අතර විගණන දිනය වන විට ද මෙම ඖෂධ තොගය සඳහා ප්‍රති අපනයන කටයුතු සිදුකරගැනීමට නොහැකි වී තිබුණි. | Covid – 19 වසංගතය සඳහා Chloroquine Phosphate ඖෂධය භාවිතා කිරීමට නිර්දේශ කිරීමත් සමගම මෙම Chloroquine Phosphate අමුද්‍රව්‍ය වෛද්‍ය සැපයුම් අංශයේ උපදෙස් පරිදි, 600 kg ක ප්‍රමාණයක් ක්ෂණිකව ප්‍රසම්පාදනය කිරීමට කටයුතු කළෙමු. නමුත් බලාපොරොත්තු වූ ආකාරයට මෙම ඖෂධය භාවිතා නොවීම නිසා මෙම තොගය භාවිතා කිරීමට නොහැකි වූ බව. | මෙම ඖෂධ තොගය යල්පැනීමට පෙර නැවත ප්‍රති අපනයනය කිරීමට හෝ මෙම නිෂ්පාදිත ඖෂධ හෝ අමුද්‍රව්‍ය තොගය දේශීය හෝ විදේශීය පාර්ශවයකට අවශ්‍ය නම් හැකි ඉක්මනින් සැපයීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) වෛද්‍ය සැපයුම් අංශයෙන් ලද Cloxacillin Sodium BP 250mg ඇණවුමක් වෙනුවෙන් මිලදී ගනු ලැබූ රු 1,261,032ක් වටිනාකමැති DHS මුද්‍රාව සහිත හිස් කරල් තොගයක් (E/H Gelatin caps No 1 Brigh Orange/Black) වෛද්‍ය සැපයුම් අංශය විසින් පෙර දැනුම් දීමකින් තොරව ඇණවුම අත්හිටුවීම | DHS මුද්‍රිත බැවින් හිස් කරල් තොගය විවෘත වෙළඳපල සඳහා Cloxacillin Sodium BP 250mg නිෂ්පාදනය කිරීමට භාවිතා කළ නොහැකි වීම හේතුවෙන් මෙම තොගය කල් ඉකුත් වන තුරු භාවිතයට ගැනීමට නොහැකි විය. | සිදුවන හානිය අවම කිරීමට කළමනාකරණය කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| හේතුවෙන් එම තොගය සෙමින් චලනය වෙමින් තිබු අතර, විගණිත දිනය වනවිට ද මෙම තොගය කල් ඉකුත්වී තිබුණි. | දැනට කල් ඉකුත් වී ඇති බැවින් ඉදිරියේදී විධිමත් ලෙස අපහරණය කිරීමට කටයුතු කරන අතර මෙවැනි හානි වලක්වා ගැනීමේ අරමුනෙන් මෙම සිද්ධියෙන් පසුව DHS මුද්‍රිත හිස් කරල් ඇණවුම් කිරීම සිදු නොකරන බව. | |

**3.4 බද්ධ ව්‍යාපාර කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දේශීයව ඖෂධ නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලිය පුළුල් කිරීම සඳහා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව හා යෝග්‍ය පෞද්ගලික ආයෝජකයන් අතර බද්ධ ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා වූ යෝජනාව යටතේ සංස්ථාව විසින් විභව ආයෝජකයන් 17 දෙනෙකු සමඟ ඖෂධ වර්ග සැපයීම සඳහා 2018 හා 2019 වර්ෂයන්හිදී ගිවිසුම්ගතවී තිබුණද විගණිත දින වන විට බද්ධ ආයෝජකයින් 15 දෙනෙකු පමණක් සංස්ථාව සමඟ සම්බන්ධ වී තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී එම බද්ධ ව්‍යාපාර සමඟ සංස්ථාව ගනුදෙනු සිදුකර තිබුණු ආකාරය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) ආයෝජකයන් 15 දෙනෙකු සමඟ ඖෂධ සැපයීම සඳහා ගිවිසුම් ගතවී තිබුණද 2022 දෙසැම්බර් 31 දින වන විටත් ආයෝජකයින් හය දෙනෙකුගෙන් පමණක් ඖෂධ මිලදී ගෙන තිබුණි. | මෙම අයෝජකයින් 15 දෙනාගෙන් වෛද්‍ය සැපයුම් අංශයට ඖෂධ සැපයීමට අවශ්‍ය නිෂ්පාදනාගාර පහසුකම් සහ සුදුසුකම් සපුරා තිබුණේ ආයෝජකයින් හය දෙනෙකු පමණක් බව. | අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ නිල කමිටුව විසින් නිර්දේශ කර තිබුණු පරිදි කටයුතු කළ යුතු අතර ගිවිසුම් ගතවූ අනෙකුත් ආයෝජකයන්ගේ තත්ත්වයන් පිළිබඳ නිරන්තරව පසු විපරම් කරමින් කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ii) බද්ධ ව්‍යාපාර සැපයුම් සඳහා ගැණුම් මිලෙන් සියයට 6 ක ලාභ ප්‍රතිශතයක් එකතු කර වෛද්‍ය සැපයුම් අංශයට ඖෂධ සපයන බවට වූ ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූලා ප්‍රකාශනවල හෙළිදරව් කර තිබුණද සිදුකල නියැදි පරික්ෂාවට අනුව එය එසේ නොවන බව ගිවිසුම්ගත ආයෝජකයෙකු වෙතින් 2022 මුල් අර්ධ වර්ෂය තුළ මිලදී ගත් ඖෂධ අයිතම 17 ක් සම්බන්ධයෙන් වූ කරුණු වලින් අනාවරණය විය. | | |
| (a) මිලදීගත් ඖෂධ අතරින් රු.14,979,403 වටිනා ඖෂධ අයිතම 02 ක් ඉන්වොයිස් මිලෙන් ආසන්න වශයෙන් සියයට 17 ක සේවා ගාස්තුවක් එනම්, රු.2,490,749 ක් උපයමින් ඒවා වෛද්‍ය සැපයුම් අංශයට රු.17,470,153 කට අලෙවි කර තිබුණි. ඒ අනුව සංස්ථාවේ බද්ධ ව්‍යාපාර ගැණුම් සම්බන්ධයෙන් වූ ලාභ ප්‍රතිපත්තිය වූ සියයට 6 ක ලාභ ප්‍රතිශතය ඉක්මවමින් සියයට 11 ක ලාභ ප්‍රතිශතයක් මත සංස්ථාව එම ඖෂධ වෛද්‍ය සැපයුම් අංශයට අලෙවි කර තිබුණි. මෙම අයිතමය සඳහා නිෂ්පාදකයා විසින් සංස්ථාවට ඉදිරිපත් කර තිබූ පිරිවැය පත්‍රිකා අනුව ඉහත තොගයේ මුළු නිෂ්පාදන පිරිවැය රු.9,037,401 ක් වූ අතර, බද්ධ ව්‍යාපාරය ඉන් සියයට 65 ත් 66 ත් අතර අධික ලාභ ප්‍රතිශතයක් උපයාගෙන ඇති බව අනාවරණය විය. | අදාල අයිතමයන් 2 සම්බන්ධයෙන් සැලකිමේදී රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව මගින් වෛද්‍ය සැපයීම් අංශය වෙත අලෙවි කිරිමේදී සලකා බලා ඇත්තේ 2020 ඔක්තෝබර් 01 වන දින පැවති මිල කමිටු අනුමැතිය අනුව වේ. නමුත් අදාල බද්ධ ව්‍යාපාරය ඔවුන්ගේ එම අයිතමයන් ඉන්වොයිස් කර ඇත්තේ 2020 පෙබරවාරි 06 සහ 10 දින පැවති මිල කමිටු මිල ගණන් පදනම් කරගෙන බව. | අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ නිල කමිටුව විසින් නිර්දේශ කර තිබුණු පරිදි මෙන්ම මූලා ප්‍රකාශනවල හෙළිදරව් කර තිබුණු ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුව අදාළ ගනුදෙනු සිදුකළ යුතුය. |
| (b) මිලදී ගත් ඖෂධ අතරින් 13 කට අදාල ඉන්වොයිසි වල රු.65,962,584 ක් වූ අතර, සියයට 17-26 අතර සේවා ගාස්තුවක් වූ රු.11,058,498 ක් එකතු කරමින් එම ඖෂධ වෛද්‍ය සැපයුම් අංශය වෙත රු.77,021,082 කට අලෙවි කර | අදාල ඖෂධ අයිතම 17 සම්බන්ධයෙන් සලකා බැලිමේදී රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව මගින් වෛද්‍ය සැපයීම් අංශයට අලෙවි කිරිමේදි | අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ නිල කමිටුව විසින් නිර්දේශ කර තිබුණු පරිදි මෙන්ම මූලා ප්‍රකාශනවල හෙළිදරව් කර තිබුණු ගිණුම්කරණ ප්‍රතිපත්ති |

| | | |
|---|---|---|
| තිබුණි. ඒ අනුව සංස්ථාව විසින් සියයට 6 ක ලාභ ප්‍රතිශතය ඉක්මවා සියයට 11-26 ත් අතර වැඩිපුර ලාභ ප්‍රතිශතයක් උපයාගෙන තිබුණි. නිෂ්පාදකයාගේ පිරිවැය පත්‍ර අනුව එම ඖෂධ වල පිරිවැය රු. 69,934,852ක් වූ අතර බද්ධ ව්‍යාපාරය සියයට 2 සිට සියයට 17 ක් අතර අලාභ ප්‍රතිශතයක් උපයාගෙන ඇති බව වැඩිදුරටත් අනාවරණය විය. මේ අනුව සංස්ථාව වෙත ඉදිරිපත් කරන ලද පිරිවැය පත්‍රිකා වල නිවැරදිතාවය පිළිබඳ සංස්ථාව විසින් පසු විපරම් කිරීමක් සිදුකර ඇති බවට විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය. | පාදක කරගෙන ඇත්තේ 2021 ඔක්තෝබර් 05 වන දින පැවති මිල කමිටු තීරණය මතයි. නමුත් අදාල බද්ධ ව්‍යාපාරය මගින් ඉන්වොයිසියන් සකසා ඇත්තේ 2021 අප්‍රේල් 05 වන දින පැවති මිල කමිටු තීරණය අනුව පැවති මිල ගණන්වලට බව. | වලට අනුව අදාළ ගනුදෙනු සිදුකළ යුතුය. |
| (iii) බද්ධ ව්‍යාපාර යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කර තිබුණු නිල කමිටුව (Official committee) විසින් නිර්දේශ කර තිබුණු පරිදි, ආයෝජකයාගේ නිෂ්පාදන ක්‍රියාවලියේ තත්ත්ව පාලනය, කළමනාකරණය හා තාක්ෂණික සහාය සංස්ථාව විසින් සැපයිය යුතු අතර, ඒ සඳහා එම ආයෝජකයාගේ ව්‍යාපාරයේ කොටස් වලින් සියයට 10 ක් සංස්ථාව වෙත නිකුත් කළ යුතු විය. කෙසේ වුවද ආයෝජකයන් හත්දෙනෙකු විසින් පමණක් සංස්ථාව වෙත කොටස් නිකුත් කර තිබුණු අතර, 2022 වර්ෂය තුළදී සංස්ථාව ගනුදෙනු සිදු කළ ආයෝජකයකු විසින් ගිවිසුමෙහි සඳහන් පරිදි තම කොටස් වලින් සියයට 10 ක් සංස්ථාව වෙත විගණිත දින වූ 2022 දෙසැම්බර් 31 දින වන විටද නිකුත් කර නොතිබුණි. | කොටස් හිමිකම් සහතික නිකුත් කිරීමට අවශ්‍ය ලිපිලේඛන සකස් කරමින් පවතින බව. | අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ නිල කමිටුව විසින් නිර්දේශ කර තිබුණු පරිදි කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (iv) සංස්ථාවේ අධ්‍යක්ෂකවරුන් නම් කළ ආයතනදෙකෙන් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව (SPMC) සන්නාමය යටතේ වර්තමානය වන විටත් ඖෂධ මිලදී ගැනීමට කටයුතු කර තිබුණි. | රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව (SPMC) සමග ගිවිසුම් ගතව කොටස් නිකුත් කර ඇති ආයතනයන් සඳහා අධ්‍යක්ෂකවරුන් නම් කර ඇත. මේ වන විට SPMC සන්නාමය යටතේ වෛද්‍ය සැපයීම් අංශය වෙත ඖෂධ සැපයීම කරනු ලබන බව. | නිෂ්පාදනාගාර ඉදිකර අවසන් වූ බද්ධ ව්‍යාපාර වෙතින් ඖෂධ මිලදී ගැනීමට කටයුතු සිදුකල යුතු අතර අනිකුත් බද්ධ ව්‍යාපාර වෙතින් නිෂ්පාදනාගාර ඉදිකර අවසන් වූ වහාම එහි නිෂ්පාදන මිලදි ගැනීමට කටයුතු කළ යුතු බව. |
| (v) බද්ධ ව්‍යාපාර 04 ක් සංස්ථාව වෙත ලබාදිය යුතු සියයට 10 ක කොටස් හිමිකමට අදාළ කොටස් සහතික ලැබී තිබුණු අතර ව්‍යාපාර දෙකකින් පමණක් 2023 වර්ෂය ආරම්භයේ සිට සංස්ථාව ඖෂධ මිලදීගෙන තිබුණි. | නිෂ්පාදනාගාර ඉදිකිරීම් වැඩ සහ ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) සහතික ලබා ගැනීම් ආදි වැඩ කටයුතු මේ වන විට නිම කර ඇති අතර 2023 වර්ෂය ආරම්භයේ සිට ඖෂධ මිලදී ගැනීම් සිදු කරනු ලබන බව. | නිෂ්පාදනාගාර ඉදිකිරීම් වැඩ සහ ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) සහතික ලබා ගැනීම් ආදි වැඩ කටයුතු මේ වන විට නිම කර ඇති බැවින් 2023 වර්ෂය ආරම්භයේ සිට ඖෂධ මිලදී ගැනීම් සිදු කල යුතුය . |

### 3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) රට තුළ පවතින ඖෂධ නිෂ්පාදනය කරනු ලබන එකම නිෂ්පාදන ආයතනය වන ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව මඟින් නිපදවනු ලබන ඖෂධ සඳහා වන ඉල්ලුම මත එහි නිෂ්පාදන ධාරිතාවය වැඩි කිරීම සඳහා යථෝක්ත රාජ්‍ය සංස්ථාවේ නිෂ්පාදන පහසුකම් ප්‍රමාණවත් නොවීම මත හොරණ මිල්ලෑව ප්‍රදේශයේ නව නිෂ්පාදනාගාරයක් ආරම්භ කිරීමට යෝජනා වී තිබූ අතර රජය විසින් රටට, ජනතාවට අවශ්‍ය ඖෂධ, අනෙකුත් වෛද්‍ය පරිභෝජන භාණ්ඩ හා වෛද්‍ය | ඖෂධ නිෂ්පාදනාගාර කාණ්ඩ 5ක් හඳුනා ගනු ලැබූ අතර, ප්‍රථම අදියර වශයෙන් නිෂ්පාදනාගාර 3 ක් ආරම්භ කිරීමටත් දෙවන අදියර යටතේ අනෙක් නිෂ්පාදනාගාර සැලසුම් කිරීමටත් යෝජනා කරන ලදී. මේ සම්බන්ධව නිෂ්පාදනාගාර 5ක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගන්නා ලද බව. | රටට හා ජාතියට මහඟු සේවයක් වන මෙවැනි ව්‍යාපෘති කඩිනම් කිරීම සඳහා ප්‍රමුඛතාවය ලබාදීය යුතුය. |

| | | |
|---|---|---|
| උපකරණ රටට ගෙන්වීම (ආනයනය) වෙනුවෙන් සැලකිය යුතු විදේශ අරමුදල් ප්‍රතිශතයක් වැය කිරීමත් එසේම සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීමටත්, අපනයනය තුළින් විදේශ විනිමය ඉපයීමටත් හා ආනයන ආදේශක තුලින් විදේශ විනිමය ඉතිරි කර ගැනීමටත් හැකි බැවින් ශ්‍රී ලංකාවට දැවැන්ත ආර්ථික ප්‍රතිලාභ ගෙන දිය හැකි විභව කර්මාන්තයක් ලෙස ඖෂධ නිෂ්පාදන කර්මාන්තය හඳුනා ගැනීම මත නව ඖෂධ නිෂ්පාදනාගාරයක් නිපදවීම තුළින් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ ධාරිතාවය වැඩි කිරීමට ලෝටස් ෆාමා (Lotus Pharma) ව්‍යාපෘතිය ආරම්භ කිරීමට 2021 මාර්තු 08 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණු අතර මේ සඳහා හොරණ මිල්ලෑවවත්ත ප්‍රදේශයේ අක්කර 65 කට ආසන්න භූමි ප්‍රදේශයක් රු.මිලියන 322.4 ක පිරිවැයක් දරා හිමිකරගෙන තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා නිලධාරීන් 03 දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබු අතර 2022.12.31 දිනට ව්‍යාපෘතිය වෙනුවෙන් ආසන්න වශයෙන් රු. මිලියන 354.96 ක් වැයකර තිබුණද මේ වන විට මෙම ව්‍යාපෘතියේ කටයුතු සැලසුම් කළ පරිදි ඉටු නොවීම මත ඉහත පරිදි රටට හා ජාතියට මහඟු සේවයක් වන මෙවැනි ව්‍යාපෘති සඳහා ප්‍රමුඛතාවය ලබාදී කඩිනම් කිරීමට සියළුම පාර්ශවයන් කටයුතු කළ යුතු අතරම ජාතික අවශ්‍යතාවයක් ලෙස පැන නැගී ඇති මෙම ව්‍යාපෘතිය කඩිනමින් අවසන් කර දැයට අවශ්‍ය ප්‍රතිලාභ ලබා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ මෙන්ම අනෙකුත් වගකිව යුතු පාර්ශවයන්ගේද අවධානය යොමුවිය යුතුව ඇත. | | |
| (ආ) නිමි ඖෂධ තොග ගබඩා කිරීමට දෙමහල් ගබඩා | කාර්ය සාධන සුරක්ෂණය සහ අත්තිකාරම් ගෙවීම් | කොන්ත්‍රාත්තුව නැවත ආරම්භකල පසු |

| | | |
|---|---|---|
| ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2018 සැප්තැම්බර් 21 දින ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණු අතර, 2022 දෙසැම්බර් 31 දින වන විට මෙම ඉදිකිරීම සඳහා රු.44,739,833 ක් වැය කර තිබුණි. මූලික ගිවිසුම ප්‍රකාරව 2019 අගෝස්තු 21 දින වන විට ඉදිකිරීම් නිම කළ යුතු වූ නමුත් විවිධ හේතුමත ඉදිකිරීම් දිගින් දිගටම ප්‍රමාද වී තිබුණි. තවද, කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත් ගිවිසුම උල්ලංඝණය කලහොත් ප්‍රසම්පාදන අස්ථිත්වය ආරක්ෂා කිරීම සඳහා ඇස්තමේන්තුගත මුදලින් සියයට පහකට නොඅඩු මුදලක් කාර්‍ය සාධන සුරක්ෂණය වශයෙන් ලබාගත යුතු අතර, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 වැඩ : (ආ) ප්‍රකාරව එය වැඩ නිම කිරීමට අපේක්ෂිත දිනෙන් ඔබ්බට දින 28 ක් වලංගු විය යුතුය. එසේ වුවද, ඉදිරිපත් කර තිබුණු කාර්යය සාධන සුරක්ෂණය 2022 සැප්තැම්බර් 04 දිනෙන් පසු කල් ඉකුත් වී තිබුණි. විගණිත දිනය වන විට වැඩ අවසන් නොකළ මෙම කොන්ත්‍රාත්තුවේ කාර්යය සාධන සුරක්ෂණය ද අත්තිකාරම් ගෙවීම් බැදුම්කරයද දීර්ඝ කිරීමට කටයුතු කර නොතිබුණි. | බැඳුම්කරය දීර්ඝ කිරීමට කොන්ත්‍රාත් සමාගම වෙත අප විසින් 2022-09-27 දිනැති ලිපිය මගින් දැනුම් දී තිබෙන නමුත් කොන්ත්‍රාත්තුවේ මිල ගණන් වෙනස් වීම සහ අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුව තීරණයක් ලබාදෙන තෙක් ව්‍යාපෘතිය අත්හිටුවා තිබූ බැවින් කාර්ය සාධන සුරක්ෂණය සහ අත්තිකාරම් ගෙවීම් බැඳුම්කරය යාවත්කාලීන කිරීමට කොන්ත්‍රාත් සමාගම කටයුතු කර නැති බව. | කොන්ත්‍රාත් පරිපාලන කටයුතු රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව විධිමත්ව සිදුකළ යුතු අතර එම කාර්යයන් මනාව කළමණාකරනය කිරීමට හා අධීක්ෂණය කිරීමටද කටයුතු කළ යුතුය. |

### 3.6 මානව සම්පත් කළමණාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංස්ථාවේ මානව සම්පත් කළමනාකරණය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) 2022 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ අනුමත සේවක සංඛ්‍යාව 427 ක් වූ අතර තත්‍ය සේවක සංඛ්‍යාව 323ක් වී තිබුණි. 2023 මාර්තු 31 දින වන විටද නිෂ්පාදන ක්‍රියාවලියට ඉතා වැදගත් අංග වූ | අනුමැතිය ඉල්ලා ඇති බව. | බඳවා ගැනීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| වට්ටෝරු පර්යේෂණ හා සංවර්ධන අංශ මෙන්ම තත්ත්ව පාලන අංශයේ ප්‍රධාන තනතුරු 02 ක් ඇතුළු වැදගත් තනතුරු කිහිපයක් සඳහා බඳවා ගැනීම් සිදුකර ගැනීමට නොහැකි වි තිබුණි. | | |
| (ii) අනුමත තනතුරු 08 ක් සඳහා බඳවා ගැනීමේ පටිපාටින් පිළියෙල කර කළමණාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය ලබා ගැනීමට 2023 මැයි 25 දින වන විටත් අපොහොසත් වී තිබුණි. | මෙම තනතුරු සඳහා බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති බව. | බඳවා ගැනීමේ පටිපාටින් පිළියෙල කර කළමණාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

**4 ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට යටත්ව ඉදිරිපත් කිරිමට කටයුතු කරනු ලබන බව | අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) ක්‍රියාකාරී සැලැස්ම සහ අදාළ වර්ෂය සඳහා වන වාර්ෂික අයවැය සමඟ මූල්‍ය පුරෝකථනය ඇතුළත් 2022-2026 කාලසීමාව සඳහා වන උපායමාර්ග සැලැස්ම (Corporate Plan) රෙජිය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් රාජ්‍ය ව්‍යවසාය අධ්‍යක්ෂ ජනරාල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණද, 2022 සිට 2026 දක්වා කාලසීමාව සඳහා වන උපායමාර්ග සැලැස්ම 2023 මැයි 04 දින වන විටද රාජ්‍ය ව්‍යවසාය අධ්‍යක්ෂ වෙතින් අනුමත වී නොතිබුණි. උපායමාර්ග සැලසුම් අනුව කාලච්ඡේදයන් තුළ ඉටුකර ගත යුතු | 2023 වර්ෂයට අදාලව උපාය මාර්ග සැලැස්ම (Corporate Plan) සහ ක්‍රියාකාරී සැලැස්ම මේ වන විටත් අප ආයතනය මගින් සකස් කර එම කටයුතු නිම කර ඇත. නමුත් එය මහා භාණ්ඩාගාරය මගින් තව දුරටත් අධ්‍යනය කරමින් විවිධ සංශෝධන කරමින් පවතින බව දන්වා ඇති බව. | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයට අනුගතව සැලැස්ම සකස් කළයුතුය. |

ක්‍රියාකාරකම් ක්‍රියාකාරී සැලැස්ම (Action Plan) තුළින් නිරූපණය වන බැවින්, උපායමාර්ග සැලැස්ම අනුමත නොවීම හේතුවෙන් කාලච්ඡේදයේ ක්‍රියාකාරකම් වල කාර්යසාධනය ඇගයීමට නොහැකිවී තිබුණි.